මුද්‍රා නාට්‍ය කලාව විකාශනය වීම සඳහා එය රසවිඳින ප්‍රේක්ෂක පිරිසක් සිටීම අනිවාර්ය වන අතරම ප්‍රේක්ෂක පිරිසට බාධාවකින් තොරව රසවිඳිය හැකි මුද්‍රා නාට්‍ය මෙරට නිර්මාණය වීම ද වැදගත් වේ. මෙම මතවාද දීර්ඝවය නිරන්තරව එකිනෙක ගැටී එක් පාර්ශවයක් අනෙකෙන් වියුක්ත වීම තුළ මුද්‍රා නාට්‍යයේ ගමන් මඟ අඩාල වන ආකාරයක් පෙනේ. ඒ නිසා රසිකත්වය හඳුනාගෙන මුද්‍රානාට්‍ය නිර්මාණය කිරීම වැදගත් වන්නා සේම එවැනි ගුණාත්මක නිර්මාණ අගය කරන ප්‍රේක්ෂක පිරිසක් මෙරට ස්ථාපිතවීම ද එක ලෙසින්ම වැදගත් වේ.

මුද්‍රා නාට්‍යය තුළ ප්‍රධාන ප්‍රකාශන මාධ්‍යය බවට පත්වනුයේ "චලනයයි." චලනය ප්‍රේක්ෂකයාට හඳුනාගැනීමට හැකිවනුයේ නර්තකයාගේ ශරීරය හරහාය. එසේවුවත් සියල් සිරුරෙන්ම ප්‍රකාශනය ඉදිරිපත් කළ හැකි නර්තන ශිල්පීන් නිර්මාණය කිරීමත් ලංකාවේ තවමත් සිදුනොවීමා නිසා මුද්‍රානාට්‍යය සංවර්ධනය අපට සිහිනයක්ව පවතී. මේ සිහිනය එළිපෙහෙළි ගැනීම සඳහා මුද්‍රා නාට්‍යය යනු මොනවාද ? මුද්‍රා නාට්‍යයට කළ හැක්කේ මොනවාද ? ආදී වූ ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගැනීම වහවහා කළ යුතුය. ඒ සඳහා කිසියම් පිටුබලයක් ලබාදීම මෙම පර්යේෂණ නිබන්ධයේ තවත් අරමුණක් බවට පත්වේ. දේශීය මුද්‍රා නාට්‍ය කලාව ආරම්භ වන වකවානුවෙහි ඒ තුළ දක්නට ලැබුණු අභාසයන් කවරාකාර වේද, එවන් අභාසයන් අපට ලැබෙනුයේ කෙසේද ? එවැනි අභාසයන් හරහා දේශීය මුද්‍රා නාට්‍යකරුවා කොතරම් දුරක් ගමන් කළේද ? යනාදිය පිළිබඳ සොයා බැලීමේ දී මෙලෙස පැන නැගුණු බොහෝ ගැටලු සඳහා පිළිතුරු ලැබෙනැයි අපේක්ෂා කරන අතරම ඒ තුළින් අදපවත්නා මුද්‍රානාට්‍යය සංවාදයටත් විකල්ප යුගයේ මුද්‍රානාට්‍යයක අනුරූවක් නොවන්නට සමාජය තුළ කිසියම් සංවාදශීලී ප්‍රතිභාවක් ගොඩනැගීම අත්‍යාවශ්‍ය බව අවධාරණය කෙරේ. මෙම පර්යේෂණ නිබන්ධයේ මාතෘකාව ප්‍රධාන වශයෙන් මාධ්‍යයන් දෙකක් ඔස්සේ ගමන් කරයි. ඉන් පළමුවැන්න දේශීය මුද්‍රා නාට්‍යය කලාවයි. දෙවැන්න බටහිර බැලේ නාට්‍ය කලාවයි. මෙම මාධ්‍යයන් දෙක එකිනෙක බද්ධ වනුයේ රංගභාෂය හරහාය. එමනිසා, මුද්‍රා නාට්‍යය පමණක් නොව සියලු නර්තන ශෛලියක් පුහුණු කරනු ලබන ශිල්පියකුට අනිවාර්යයෙන්ම උපකාරී වන රංගභාෂා ක්‍රමවේදයක් පිළිබඳව පුළුල් සාකච්ඡා කිරීමක් මෙහිදී සිදු කෙරේ. ඉන් අනතුරුව දේශීය මුද්‍රානාට්‍ය නිර්මාණකරුවා බටහිර බැලේ නාට්‍යයෙහි ලක්ෂණ ස්වකීය නිර්මාණ භූමිකාවන් සඳහා උපයුක්ත කොටගත් ආකාරය විමර්ශනාත්මකව දැක්වීමක් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. බොහෝ අවස්ථාවන්හි දී දේශීය මුද්‍රා නාට්‍ය තුළ උඩරට නර්තන සම්ප්‍රදායයට අදාල අංගහාර ක්‍රමවේද බැලේ චලනයන් සමඟ සම්මිශ්‍රිත කර ඉදිරිපත් කෙරෙනු දැකගත හැකිය. සෙසු නර්තන සම්ප්‍රදායයන් ද්විත්වයට වඩා වැඩි වශයෙන් උඩරට නර්තන කලාව මේ සඳහා භාවිත කරනුයේ කවර කාරණයක් නිසාද යන්න පිළිබඳව සාකච්ඡාවක් ඇරඹීමට හේතු වූ සාධකය එය වේ.